# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1662/1 - 2010 ජූලි 12 වැනි සඳුදා - 2010.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2004 අංක 11 දරන මුදල් පනත**

2004 අංක 11 දරන මුදල් පනතේ 22 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 26 වැනි වගන්තිය යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

මහින්ද රාජපක්ෂ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2010 ජූලි මස 12 වැනි දින,
කොළඹ,
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ දී ය.

නියෝග

1. මේ නියෝග 2010 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර එය 2010.07.15 වැනි දින සිට බලපැවැත්වේ.

2. මේ නියෝග 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය යටතේ බලපත්‍රලාභී ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් සම්බන්ධයෙන් අදාළ වේ.

3. 2004 අංක 11 දරන මුදල් පනතේ III වැනි කොටස යටතේ පනවන ලද (මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද මෙහි මින්මතු දක්වා ඇති ආකාරයට ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන හෝ අවසාන වන සහ එන හෝ යන සෑම ජාත්‍යන්තර දුරකථන ඇමතුමක් සම්බන්ධයෙන්ම සෑම ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකරුවකු විසින් ම කොමිෂන් සභාවට ගෙවනු ලැබිය යුතු ය.


1A - G 13118 — 1530 (2010/07)

*සැ. යු.- අති විශෙෂ ගැසට් අංක 1661/01 කාණ්ඩය අංක 1661/42 න් අවසන් වේ.*

**එන ජාත්‍යන්තර ඇමතුම් මත බද්ද**

4. එන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් වූ බද්ද මේ නියෝගවල (I) වැනි උපලේඛනයේ , "අ" වගුවේ සඳහන් කාලසීමාවන් සඳහා සහ එසේ සඳහන් අනුප්‍රමාණ අනුව අය කරනු ලැබිය යුතු ය.

5. වෙන් වශයෙන් වූ බදු දෙකක පදනම මත එනම් එන දේශීය ප්‍රවේශ ගාස්තුව (එ.දේ.ප්‍ර.ගා.) සහ විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (වි.සං.සං.ගා.) යන බදුවල පදනම මත 4 වැනි නියෝගය ප්‍රකාරව එන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් අයකර ගනු ලබන සහ එකතු කරගනු ලබන බද්ද කොමිෂන් සභාව විසින් බෙදා හරිනු ලැබිය යුතු ය. එක් එක් වර්ෂය සඳහා එ.දේ.ප්‍ර.ගා. සහ වි.සං.සං.ගා. වශයෙන් බැර කරනු ලැබිය යුතු බදු ප්‍රමාණය මේ නියෝගවල උපලේඛනයේ 'ආ' සහ 'ඇ' වගුවල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ අනුව විය යුතුය. ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකරුවන් I උපලේඛනයේ 'ආ' සහ 'ඇ' වගුවේ දක්වා ඇති පරිදි එ.දේ.ප්‍ර.ගා. ඍජුව දේශීය පොදු යතුරු පුවරු දුරකථන ජාල (පො.ය.පු.දු.ජා.) ක්‍රියාකරුට ගෙවිය යුතු ය.

6. ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකරු පො.ය.පු.දු.ජා. ක්‍රියාකරුවකුද වන අවස්ථාවක එම ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකරු මෙම නියෝගවල උපලේඛන I හි 'ආ' වගුව පරිදි එ.දේ.ප්‍ර.ගා. අදාළ සමාගම් අතර හෝ සමාගම් තුල ගනුදෙනු බේරුම්කර ගැනීමට අවසර ලැබේ.

7. උපලේඛන I හි 'ඇ' වගුවේ දක්වා ඇති පරිදි අයකරන ලද වි.සං.සං.ගා. න් සියයට පනහක් (50%) ක්, නියෝග 11 හි දක්වා ඇති පරිදි ප්‍රසිද්ධ කර ඇති නියමිත දිනයෙන් දින 15 ක් ඉක්මයාමට මත්තෙන් ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කල යුතු ය.

8. ජාත්‍යන්තර දුරකථන ක්‍රියාකරුවන්ගෙන් උපලේඛන I 'ඇ'වගුව යටතේ එක්රැස්කරන ලද වි.සං.සං.ගා. ඉතිරි සියයට පනහ (50%) අරමුදල් ප්‍රමාණය හා එකී අරමුදල් මත උපයන පොළිය කොමිෂන් සභාව සුදුසු යැයි තීරණය කරනු ලබන ආකාරයට විශ්වීය සේවා ලබා ගැනීම සහ, ඒ සඳහා ප්‍රවේශ වීමේ අරමුණ ඉටු කර ගැනීම වෙනුවෙන් විදුලි සංදේශ කර්මාන්තය සංවර්ධනය කිරීම උදෙසා පාවිච්චි කිරීම හෝ බෙදා හැරීම කළ යුතු ය.

**යන ජාත්‍යන්තර ඇමතුම් මත බද්ද**

9. සෑම වර්ෂයකම (මෙහි මින්මතු යන දේශීය ප්‍රවේශ ගාස්තුව (ය.දේ.ප්‍ර.ගා.) යනුවෙන් සඳහන් කරනු ලබන) යන ජාත්‍යන්තර ඇමතුම් සම්බන්ධයෙන් වූ බද්ද ශුන්‍ය විය යුතු ය.

**සාමාන්‍ය**

10. කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද මුදල් ගෙවීමට නියමිත අවසාන දිනය අවසන්වීමට පෙර I වැනි උපලේඛනයේ 'ඇ' වගුවේ සඳහන් ගාස්තු ප්‍රකාරව විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව කොමිෂන් සභාව විසින් ප්‍රසිද්ධ කරන නියමිත දින ඉක්මවීමට මත්තෙන් සෑම ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවකු විසින්ම කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

11. එක් එක් මාසය සඳහා අදාළ වන විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව ගෙවීමට නියමිත අවසාන දිනය එක් එක් වර්ෂය ආරම්භයේ කොමිෂන් සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

12. සෑම ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවෙකු විසින් ම ස්වකීය ජාලය ඇතුළත අවසන් වන සහ ආරම්භ වන ජාත්‍යන්තර ඇමතුම් සඳහා භාවිත කරන ලද සම්පූර්ණ මිනිත්තු ප්‍රමාණය පිළිබඳ වාර්තාවක් එක් එක් මාසය සම්බන්ධයෙන් එම ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

13. මේ නියෝගවල II වැනි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති නියමිත ආකෘතිපත්‍රවල සෑම මාසයකම එන සහ යන දුරකථන ඇමතුම් නිශ්චිතව සඳහන් වන වාර්තාවක් මුදල් ගෙවීමට නියමිත අවසාන දිනයට දින පහකට පෙර ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු සහ දේශීය පො.ය.පු.දු.ජා. ක්‍රියාකරු විසින් කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු ය.

14. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවකුට සෘජු අන්තර් සම්බන්ධතාවයක් නොමැති අවස්ථාවක 30 : 70 අනුපාතයට එන දේශීය ප්‍රවේශ ගාස්තු බෙදා ගැනීම අවස්ථාවෝචිත පරිදි පිළිවෙලින් සංක්‍රමණ ක්‍රියාකරුගේ සහ ඇමතුම් අවසන් කිරීමේ ක්‍රියාකරුගේ වගකීම වන්නේ ය. කර්මාන්තය විසින් ඉදිරිපත් කරනු ලබන නියෝජන සළකා බැලීමෙන් පසු කොමිෂන් සභාව විසින් කලින් කල මෙම අනුපාතය වෙනස් කරනු ලැබිය හැකි ය.

15. 12, 13 සහ 17 වැනි නියෝගවල සඳහන් තොරතුරු ඉදිරිපත් කිරීම පැහැර හරින යම් ක්‍රියාකරුවකුට එරෙහිව උචිත ක්‍රියාමාර්ග නිශ්චිතව දක්වමින් පනතේ 23 වැනි වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

16. ඉහත 8 වැනි නියෝගය ක්‍රියාත්මක කිරීමට අදාලව මාර්ගෝපදේශ, පනතේ 23 වැනි වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

17. ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් සහ දේශීය පො.ය.පු.දු.ජා. ක්‍රියාකරුවන් විසින් සියලු ගාස්තු සම්බන්ධයෙන් වෙන් වෙන් වශයෙන් ගිණුම් පවත්වාගෙන යා යුතු අතර, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන, කවර හෝ අවස්ථාවක දී කොමිෂන් සභාව විසින් පරීක්ෂණය කිරීමේ සහ විගණනය කිරීමේ කාර්යය සඳහා සියලු වාර්තා ඉදිරිපත් කොට ලබා දිය යුතු ය.

18. මේ නියෝග යටතේ ගෙවන ලද බදු මුදල් සහ බෙදා හරින ලද අරමුදල් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් එක් එක් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවකු සම්බන්ධයෙන් බැංකු ගිණුමක් සහ වෙන් වශයෙන් වූ වාර්තා පවත්වාගෙන යා යුතු ය. විදුලි සංදේශ සංවර්ධන බදු වශයෙන් එකතු කරනු ලැබූ (පොලී ආදායම් හැර) 8 වැනි නියෝගය පරිදි බෙදා හරිනු නොලැබූ යම් මුදල් එසේ එකතුකර ගත් වර්ෂයේ සිට අවුරුදු තුනක් ඉකුත් වූ පසු ඒකාබද්ධ අරමුදලට ප්‍රේෂණය කළ යුතු ය.

19. තත්කාර්යය ක්‍රියාත්මක කිරිම සඳහා නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව මෙහි සඳහන් කර ඇති කාර්යය ඉටුකර ගැනීම සඳහා I වැනි උපලේඛනය ‘ඇ’ වගුව යටතේ කොමිෂන් සභාව වෙත ගෙවන ලද අරමුදල් පරිහරණය කර හෝ බෙදාහරින තුරු කොමිෂන් සභාව විසින් එම අරමුදල් කළමනාකරණය කරමින් ආයෝජනය කළ යුතු ය.

20. 2009 දෙසැම්බර් මස 29 වැනි දිනැති නියෝගයන් පරිච්චින්න කර අංක 1634/33 යටතේ, 2010 ජනවාරි මස පළමුවැනි දින *අති විශෙෂ ගැසට් පත්‍රය* මගින් ප්‍රසිද්ධ කරන ලද, 2005 මාර්තු මස 31 දිනැති අංක 1386/24 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* ප්‍රසිද්ධ කරන ලද 2005 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීමේ) නියෝගය උපලේඛන I සහ උපලේඛන III හි ‘අ’,‘ආ’,‘ඇ’ වගුවල සඳහන් 2010 වසර සඳහා අදාල වන බදු ගාස්තු නැවත පරිච්චින්න කර ඒ වෙනුවට පහත සඳහන් උපලේඛන ආදේශ කරනු ලැබේ.

### I වැනි උපලේඛනය

### ‘අ’ වගුව

*(4 වැනි නියෝගය)*

***එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු අනුපාත***

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.04.01 - 2010.07.14 | 9.00 |

'ආ' වගුව

*(5 වැනි නියෝගය)*

*එන දේශීය ප්‍රවේශ ගාස්තු (එ.දේ.ප්‍ර.ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය*

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.04.01 - 2010.07.14 | 5.20 |

'ඇ' වගුව

*(5 වැනි නියෝගය)*

*විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (වි.සං.සං.ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය*

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.04.01 - 2010.07.14 | 3.80 |

III වැනි උපලේඛනය

*(9 වැනි නියෝගය)*

*දේශීය පො.ය.පු.ජා. ක්‍රියාකරුවන් විසින් බේරුම් සඳහා සුදුසුකම් ලැබීමේ ගාස්තු*

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.04.01 - 2010.07.14 | 2.50 |

21. 2010 ජනවාරි මස පළමු වැනි දිනැති අංක 1634/33 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද, 2009 දෙසැම්බර් මස 29 වැනි දිනැති නියෝගය හා 2005 මාර්තු මස 31 දිනැති අංක 1386/24 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද 2005 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවූ) නියෝගයෙහි අඩංගු 6,7,10,11,12,13,14,15,16,17,18,19 නියෝග හා එහි උපලේඛන II හා IV මෙමගින් පරිච්ජින්න කරනු ලැබේ.

22. මෙහි කුමක් සඳහන් වුව ද, 2005 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවූ) නියෝගයෙහි, නියෝග අංක 9 යටතේ අයකර ගන්නා ලද විදුලි සංදේශ සංවර්ධන බදු අරමුදලින් තුනෙන් දෙකක් (2/3) අදාළ දුරකථන සමාගම්වලට බෙදා හැරීම කොමිෂන් සභාව මගින් දිගටම කළ යුතු වේ.

23. 2005 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවූ) නියෝගයෙහි, නියෝග 9 යටතේ අයකරගන්නා ලද නමුත් බෙදා නොහරින ලද විදුලි සංදේශ සංවර්ධන අරමුදලේ තුනෙන් දෙකේ (2/3) කොටසින් දේශීය පොදු යතුරු පුවරු ජාල ක්‍රියාකාර සමාගම්වලට බෙදා අවසානයේ ඉතිරි වන මුදල් කොමිෂන් සභාව විසින් ඒකාබද්ධ අරමුදලට බැර කළ හැකි ය.

24. මෙහි සඳහන් කර ඇති අවස්ථාවක් හැර 2005 අංක 1 දරන ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවූ) නියෝගයට අනුව ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවන් විසින් ලද හෝ ගෙවීමට ඇති අරමුදල් සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එහි ඇති නියෝග 10,11,12,13,14,15,16,17 හා 18 අදාළ වනු ඇත.

**අර්ථනිරූපණය**

25. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස –

"**කොමිෂන් සභාව**" යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව අදහස් වේ.

"**ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු**" යන්නෙන් 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වැනි වගන්තිය යටතේ බලපත්‍ර ලත් ක්‍රියාකරුවකු අදහස් වේ.

"**දේශීය පොදු යතුරු පුවරු දුරකථන ජාල ක්‍රියාකරු**" යන්නෙන් ශ්‍රී ලංකාවෙහි ස්ථිර දුරකථන සේවා හෝ සෙලියුලර් ජංගම දුරකථන සැපයීමට බලපත්‍ර ලත් ක්‍රියාකරුවකු අදහස් වේ.

"**අන්තර ක්‍රියාකරු**" යන්නෙන් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගේ සිට වෙනත් දේශීය පො.ය.පු.දු.ජා. ක්‍රියාකරුවකුගේ ජාලයකට ජාත්‍යන්තර මාර්ගය සම්බන්ධ කරන දේශීය පො.ය.පු.දු.ජා. ක්‍රියාකරුවකු අදහස් වේ.

"**පොළී ආදායම**" යන්නෙන් විදුලි සංදේශ සංවර්ධන ගාස්තු අරමුදල් ආයෝජනය කිරීමෙන් ලැබෙන ආදායම අදහස් වේ.

I වැනි උපලේඛනය

'අ' වගුව

*(4 වැනි නියෝගය)*

***එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුපාත***

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.07.15 - 2010.12.31 | 7.00 |
| 2011 | 2011.01.01 - 2011.12.31 | 7.00 |

'ආ' වගුව

*(5 වැනි නියෝගය)*

***එන දේශීය ප්‍රවේශ ගාස්තු (එ.දේ.ප්‍ර.ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය***

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.07.10 - 2010.12.31 | 5.50 |
| 2011 | 2011.01.01 - 2011.12.31 | 5.50 |

‘ඇ’ වගුව

*(5,7 සහ 8 වැනි නියෝග)*

*විදුලි සංදේශ සංවර්ධන ගාස්තු (වි.සං.සං.ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය*

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව මිනිත්තුවකට ඇ.ඩො.ශත* |
|---|---|---|
| 2010 | 2010.07.15 - 2010.12.31 | 1.50 |
| 2011 | 2011.01.01 - 2011.12.31 | 1.50 |

II වැනි උපලේඛනය

*(13 වැනි නියෝගය)*

*ඇමතුම් අවසානය*

| *ඇමතුම් අවසාන වූ ජාලයේ ක්‍රියාකරු* | *එන ඇමතුම් මිනිත්තු ගණන (එක් දශමස්ථානයකට දක්වන්න)* | *දේශීය පොදු දුරකථන යතුරු පුවරු ජාල ක්‍රියාකරුට ගෙවන ලද එන දේශීය පිවිසුම් ගාස්තු ගෙවීම* |
|---|---|---|
| (අ) - ක්‍රියාකරු | | |
| (ආ) - ක්‍රියාකරු | | |

*ඇමතුම් අවසානය*

| *ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු* | *එන ඇමතුම් මිනිත්තු ගණන (එක් දශමස්ථානයකට දක්වන්න)* | *දේශීය පොදු දුරකථන යතුරු පුවරු ජාල ක්‍රියාකරුට ගෙවන ලද එන දේශීය පිවිසුම් ගාස්තු ගෙවීම* |
|---|---|---|
| (අ) - ක්‍රියාකරු | | |
| (ආ) - ක්‍රියාකරු | | |

*ඇමතුම් ආරම්භය*

*(13 වැනි නියෝගය)*

| *ඇමතුම් ආරම්භ වූයේ කවර ක්‍රියාකරුගේ ජාලයෙන්ද* | *යන ඇමතුම් මිනිත්තු ගණන (එක් දශමස්ථානයකට දක්වන්න)* | *දේශීය පොදු දුරකථන යතුරු පුවරු ජාල ක්‍රියාකරුට ගෙවන ලද යන දේශීය පිවිසුම් ඇමතුම් ගාස්තු ගෙවීම* |
|---|---|---|
| (අ) - ක්‍රියාකරු | | |
| (ආ) - ක්‍රියාකරු | | |

| *ජාල ඇමතුම් ආරම්භ වූ ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු* | *යන ඇමතුම් මිනිත්තු ගණන (එක් දශමස්ථානයකට දක්වන්න)* | *එක් එක් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුගෙන් අයවිය යුතු සහ යන දේශීය පිවිසුම් ඇමතුම් ගාස්තු ගෙවීම* |
|---|---|---|
| (අ) - ක්‍රියාකරු | | |
| (ආ) - ක්‍රියාකරු | | |

*හුවමාරු ඇමතුම්*

*(15 වැනි නියෝගය)*

| *ඇමතුම් හුවමාරු වූයේ කවර ක්‍රියාකරුගේ ජාලය යටතේද යන වග* | *ඇමතුම් අවසාන ක්‍රියාකරු* | *එන ඇමතුම් මිනිත්තු ගණන (එක් දශමස්ථානයකට දක්වන්න)* | *හුවමාරු ක්‍රියාකරුට ගෙවිය යුතු ගාස්තුව (30%)* | *ඇමතුමේ අවසාන ක්‍රියාකරුට ගෙවිය යුතු එ.දේ.ප්‍ර.ගා. ගෙවීම (70%)* |
|---|---|---|---|---|
| (අ) - ක්‍රියාකරු | | | | |
| (ආ) - ක්‍රියාකරු | | | | |

07-813

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.